නිපුණතාව 2.0 - ව්‍යාපාර දත්ත සංවිධානය කර ඉදිරිපත් කරයි.
නිපුණතා මට්ටම 2.4 - සටහන් භාවිතයෙන් ව්‍යාපාර තොරතුරු ඉදිරිපත් කරයි.

දත්තවල ස්වභාවය,ප්‍රමාණය හා ඉදිරිපත් කිරීමේ අරමුණ යනාදී සාධක සැලකිල්ලට ගෙන දත්තවලට උචිත වන පරිදි භාවිත කළ හැකි විවිධ රූප සටහන්

1.සරල තීරස්/සිරස් තීරු සටහන්
2.සංරචක තීරු සටහන්
3.බහු ගුණ තීරු සටහන්
4.පයි සටහන්/වට සටහන්
5.පැතිකඩ සටහන්
6.සිතිලිය

පහත දත්ත නිරූපණය කිරීමට සුදුසු සටහනක් අඳින්න.

1.වර්ෂ 5ක ආයුකාලයක් සහිත යන්ත්‍රයකින් එක් එක් වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද ඒකක ගණන පහත දැක්වේ.

වර්ෂය	නිෂ්පාදිත ඒකක ගණන
2015	1800
2016	2400
2017	900
2018	1200
2019	900

2.බේකරියක සතියක් තුළ දෛනිකව අලෙවිකරණ ලද පාන් ගෙඩි ගණන පහත පරිදි විය.

දවස	පාන් ගෙඩි ගණන
සඳුදා	150
අඟහරුවාදා	160
බදාදා	250
බ්‍රහස්පතින්දා	200
සිකුරාදා	240
සෙනසුරාදා	150
ඉරිදා	180